**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය


දුරකථන: +94 (11) 202-8500 ● ෆැක්ස්: +94 (11) 202-8621

විද්‍යුත් තැපෑල: BickelCE@state.gov ● වෙබ්: http://lk.usembassy.gov


## එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (USDA) ශ්‍රී ලංකාවේ ළමයින් වෙත තවත් පස් වසරක් සඳහා මැක්ගවර්න්-ඩෝල් පාසල් පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ඩොලර් මිලියන 32.5ක් කැපකරයි

කොළඹ, 2023 නොවැම්බර් 17: එ.ජ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංකාවට ලබාදීම පිණිස අළුතින් ඇ. ඩොලර් මිලියන 32.5ක මුදලක් සාගින්න අඩු කිරීම සඳහා සහ සාක්ෂරතාවය හා ප්‍රාථමික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා වන ආහාර ආධාර මුලපිරීමක් වන, මැක්ගවර්න්-ඩෝල් ‘අධ්‍යාපනය සහ ළමා පෝෂණය සඳහා ආහාර’ ජාත්‍යන්තර වැඩසටහන වෙත ලබාදෙන බව කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය නිවේදනය කරන්නේ සතුටිනි. පාසැලේදී ආහාරවේල්, ගුරුවරුන්ට පුහුණුව සහ සම්බන්ධිත සහය ලබාදීම හරහා මෙම මැක්ගවර්න්-ඩෝල් ව්‍යාපෘති පාසැල්වලට ළමයින් ඇතුළත්වීම සහ අධ්‍යාපනික කාර්යසාධනය වැඩිකරන්නට සහය දෙයි. ශ්‍රී ලංකා රජයේ අදාළ පාර්ශව සමග සහයෝගීතාවයෙන් සේව් ද චිල්රන් සංවිධානය ක්‍රියාත්මක කළ, දැනටමත් පවතින වැඩසටහනක් පදනම් කරගනිමින් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන හරහා නුවරඑළිය, බදුල්ල, මොනරාගල, රත්නපුර, කිලිනොච්චිය, මුලතිවු, ත්‍රිකුණාමලය, සහ කොළඹ දිස්ත්‍රික්කවල ඉදිරි පස් වසරක් මුළුල්ලේ පාසල් ළමුන් 200,000කට වඩා ප්‍රතිලාභ ලබනු ඇත.

එ.ජ. අරමුදල් ලබා පාසල් පෝෂණ වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක වන ස්ථාන ගණනාවකට ම චාරිකා කර ඇති එ.ජ. තානාපති ජුලී චං‍ග් මහත්මිය මෙසේ පැවසුවාය, "පාසල් පෝෂණ වැඩසටහන ශ්‍රී ලංකාවේ ළමයින් මත ඇති කරන පරිවර්තනීය බලපෑම මා දැක තිබෙනවා. ශ්‍රී ලංකාවේ පාසල් පෝෂණ වැඩසටහන සඳහා සහය ලබාදීමට එක්සත් ජනපදය දිගින් දිගටම සහය දෙමින් සිටිනවා, මැක්ගවර්න්-ඩෝල් අධ්‍යාපනය සහ ළමා පෝෂණය සඳහා ආහාර ජාත්‍යන්තර වැඩසටහන හරහා USDA ලබදෙන ඇ. ඩොලර් මිලියන 32.5ක දායකත්වය ඊට උදාහරණ සපයනවා. දිවයින මුළුල්ලේ ළමයින් සඳහා පෝෂණය සහ අධ්‍යාපනය වැඩිදියුණු කරන මේ වැඩසටහන් ඉතා වැදගත් වන අතර, ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් අපේ ඇති දිගුකල් පවත්නා කැපවීම ඉන් පිළිබිඹු වනවා."

මෙම නව අරමුදල්, USDA සහාය දක්වන Promoting Autonomy for Literacy and Attentiveness through Market Alliances (PALAM/A) (වෙළඳපල සන්ධාන හරහා සාක්ෂරතාවය සහ අවධානය සඳහා ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම) නම් ඩොලර් මිලියන 27.5 ක ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙන යෑමක් වේ. සේව් ද චිල්ඩ්‍රන් සංවිධානය අධ්‍යාපන අමාත්‍යාංශයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් ඒ හරහා දිස්ත්‍රික්ක හතක (නුවරඑළිය, බදුල්ල, මොණරාගල, රත්නපුර, කිලිනොච්චි, මුලතිව් සහ ත්‍රිකුණාමලය) පාසල් 852 ක ළමුන් 95,000 කට අධික පිරිසකට රජයේ පාසල් ආහාර වැඩසටහනේ කොටසක් ලෙස පෝෂ්‍යදායී ආහාර ලබා දෙයි. තවද මෙම ව්‍යාපෘතිය මගින් ළමුන්ගේ සාක්ෂරතා කුසලතා වර්ධනය කිරීම, ගුරුවරුන්ගේ වෘත්තීය පුහුණුව සහ සුරක්ෂිත පානීය ජලය, මුළුතැන්ගෙයි පහසුකම් වැඩිදියුණු කිරීම සහ පාසල්වල සනීපාරක්ෂක හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සහාය වේ.

මැක්ගවර්න්-ඩෝල් ‘අධ්‍යාපනය සහ ළමා පෝෂණය සඳහා ආහාර’ ජාත්‍යන්තර වැඩසටහන ලොව පුරා අඩු ආදායම්ලාභී, ආහාර හිඟ රටවල අධ්‍යාපනය, ළමා සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව සඳහා උපකාර කරයි. පාසල් පෝෂණය සහ මාතෘ සහ ළමා පෝෂණ ව්‍යාපෘති සඳහා ආධාර කිරීම සඳහා එක්සත් ජනපද කෘෂිකාර්මික භාණ්ඩ පරිත්‍යාග කිරීම මෙන්ම මූල්‍ය සහ තාක්ෂණික ආධාර මෙම වැඩසටහන හරහා සපයයි.

ජනතාව අතර ඇති ශක්තිමත් සම්බන්ධතා හරහා අවධාරනය වන පොහොසත් ඉතිහාසයක් සහිත එක්සත් ජනපද-ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 75 වන සංවත්සරය මේ වසරේ සනිටුහන් කෙරේ. අප රටවල් එක්ව ලබා ඇති ප්‍රගතිය ශ්‍රී ලාංකිකයන්ට දීප්තිමත් අනාගතයක් ගොඩනැගීමට උපකාර වනු ඇත.